GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2018.07.05

මාධ්‍ය නිවේදනයයි

**වැඩ බලන අධ්‍යක්ෂවරයාගේ අත්තනෝමතික ක්‍රියාකාරකම් වලට විරෝධය පල කරමින් එලඹෙන සඳුදා සිට ක්‍රියාත්මක වීමට නියමිත ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානයේ වැඩ වර්ජන ක්‍රියාමාර්ගය.**

ජාතික පාරවිලයන සේවාවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස සෞඛ්‍ය අමාත්‍යවරයාගේ ආශිර්වාදයෙන් පත් කෙරුණු වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන සෞඛ්‍ය ක්ෂේත්‍රය තුල සිටින ඉතා කුප්‍රකට චරිතයක් බව අවිවාදිතය.

2015 ජනාධිපතිවරණයේදී වර්තමාන අතිගරු ජනාධිපතිතුමා ඉතා ද්වේශ සහගත ලෙසත්, අපහාසාත්මක ලෙසත් විවේචනය කරමින් ආයතන සංග්‍රහයේ වගන්ති උල්ලංඝණය කල හේතුවෙන් වැඩ තහනමකට ද ලක්ව සිටි මෙම වෛද්‍යවරයා මේ වන විට තම පෞද්ගලික හා ආර්ථිකමය අවශ්‍යතා සඳහා වර්තමාන සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මහතා සමග එක්ව කටයුතු කරන බව නොරහසකි.

පසුගිය දෙසැම්බර් මස වෛද්‍ය බෙල්ලන ජාතික රුධිර පාරවිලයන සේවාවේ වැඩබලන අධ්‍යක්ෂ ධුරයට පත් වෙයි.

එතැන් සිට ඉතා ඉහළ ජාතික වැදගත්කමකින් යුත් රුධිර පාරවිලයන සේවාව වෙත කණකොකා උදාවීම ඇරඹෙයි.

ජාතික රුධිර පාරවිලයන සේවාව හෙවත් මධ්‍යම ලේ බැංකුව ආශ්‍රිතව සිදු වන මෙම අකටයුතුකම් පිළිබඳ තවදුරටත් නිහඬව සිටිය යුතු නැති බව එහි සේවය කරනා සමස්ථ වෛද්‍යවරුන් තිරණය කරයි. සිදුවන අකටයුතුකම් හා අක්‍රමිකතා පිළිබඳ ඔවුන් විසින් එලිදරව් කිරීම් සිදු කරයි.

වෛද්‍ය බෙල්ලන තම සුපුරුදු ක්‍රියාකාරකම් එලිදක්වමින් අදාල වෛද්‍යවරුන්ගෙන් ද්වේශ සහගත ලෙස පලිගැනිම ආරම්භ කරනුයේ මේ සමගය.

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානයට අනුබද්ධ ශාඛා සංගම් මගින් වැඩ බලන අධ්‍යක්ෂවරයාගේ අකටයුතුකම් ඉතා පැහැදිලිව ඉදිරිපත් කර ඇති අතර මේ වන විට ඒ මත පදනම්ව සෞඛ්‍ය ලේකම්වරයා විසින් විමර්ශණය ආරම්භ කර ඇත.

ශාඛා සංගමය පෙන්වා දී ඇති වෛද්‍ය බෙල්ලනට එරෙහි චෝදනා කිහිපයක් පහත දැක්වේ.

1. අධ්‍යක්ෂ තනතුර අවභාවිතා කරමින් සමහරක් සැපයුම්කරුවන්ට වාසි සහගත වන අයුරින් කටයුතු කිරිම.
2. තාක්ෂණික කමිටු වල තිරණ තනිමතයට අභිබවා කටයුතු කිරීම.
3. ව්‍යාජ ලේඛන සකස් කරන ලෙස වෛද්‍ය නිලධාරින් වෙත තර්ජනාත්මක ලෙස බලපෑම් කිරීම
4. තුන් වෙනි පාර්ශවයන් ඉදිරිපිටදී වෛද්‍ය නිලධාරින් අපහසුතාවයට හා හිරිහැරයට ලක්වන අයුරින් කටයුතු කිරීම.
5. ජාතික රුධිර පාරවිලයන නොමැති විවිධ සේවා කාණ්ඩ අතර අසමගියක් නිර්මාණය කොට අර්බුධකාරි තත්ත්වයන් ඇති වීමට කටයුතු කිරීම.
6. අනාරක්ෂිත සේවා පරිසරයක් නිර්මාණය කරමින් තමනට ගැතිකම් කරන වෘත්තිය සමිති නායකයින් හට ජාතික රුධිර පාරවිලයන සේවාවේ දත්ත හා තොරතුරු වෙත ලගා වීමට අවස්ථා නිර්මාණය කර දැමීම.
7. ජාතික රුධිර පාරවිලයන සේවාවේ සම්පත් අවභාවිතා කරමින් බාහිර පාර්ශව සමග අධ්‍යක්ෂ නිල කාමරය තුල සාකච්ජා පැවැත්වීම.
8. වෛද්‍ය නිලධාරින් පෞද්ගලික සමාගම් වෙත නිරාවරණය කිරීම හා එම සමාගම් වලට වාසි සහගත වන අයුරින් කටයුතු කරනා ලෙස බලපෑම් කිරීම.

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ විධායක සභාව මේ පිළිබඳ වැඩිදුරටත් සොයා බැලිමෙන් අනතුරුව මෙම අක්‍රමිකතා පිළිබඳ සෞඛ්‍ය ලේකම්වරයා වෙත කරුණු දක්වන ලදී.

ඒ අනුව පහත දැක්වෙන එකගතා සඳහා එලඹෙන ලදී.

1. වැඩ බලන අධ්‍යක්ෂවරයාට එරෙහිව විමර්ශණයක් ආරම්භ කර කඩිනමින් එහි කටයුතු සිදු කල යුතු බව.
2. තාක්ෂණික ඇගයීම් කමිටු වල තීන්දු තීරණ වලට පරිබාහිරව ජාතික රුධිර පාරවිලයන සේවාවන් සඳහා මිලදී ගැනීම් වහාම අත්හිටවන ලෙස.
3. ජාතික රුධිර පාරවිලයන සේවාවේ සීමාවාසික වෛද්‍යවරුන් ඉලක්ක කරගනිමින් වැඩ බලන අධ්‍යක්ෂවරයා සිදු කරන ද්වේශ සහගත පලිගැනීම් හා අවලාද නැගීම් වහාම අත්හිටුවිය යුතු බව.
4. පරීක්ෂණ කටයුතු නිමවන තෙක් ජාතික රුධිර පාරවිලයන සේවාව තුල අත්තනෝමතික ඒකපාර්ශ්වික වෙනස්කම් සිදු කිරීම වැඩ බලන අධ්‍යක්ෂවරයා විසින් නතර කල යුතු බව.

අප වෙත දැනගැනීමට ලැබී ඇති පරිදි සෞඛ්‍ය ලේකම්වරයා විසින් මේ සියලු කරුණු වැඩ බලන අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දී තිබියදීත් වෛද්‍ය බෙල්ලන සෞඛ්‍ය ලේකම්වරයාගේ නියෝග මායිම් නොතකමින් කටයුතු කරමින් සිටියි. ඒ සෞඛ්‍ය ඇමතිවරයාගේම බලපුලුවන්කාරකම් තමන්ට ආදේශ කර ගැනිමෙන් බව බැලු බැල්මට පෙනි යයි.

ආයතන සංග්‍රහය උල්ලංඝණය කරමින්, ජාතික රුධිර පාරවිලයන සේවාවේ විශේෂඥ වෛද්‍යවරුන් හා අනෙකුත් වෛද්‍යවරුන්ට අපහාස වන අයුරින්, ජාතික රුධිර පාරිවිලන සේවාව පිළිබඳ මහජන විශ්වාසය පලුදු වන අයුරින් වැඩ බලන අධ්‍යක්ෂවරයා විසින් මාධ්‍යයට නිවැරදි නොවන තොරතුරු ලබා දෙමින් සිටියි. මේ පිළිබඳ ක්ෂණික ක්‍රියාමාර්ග ගන්නා මෙන් සෞඛ්‍ය ලේකම්වරයා වෙතින් අප විසින් ඉල්ලා ඇත.

ඒ අනුව වෛද්‍ය බෙල්ලන වැඩ බලන අධ්‍යක්ෂ ධුරයට නොගැලපෙන බව දිනෙන් දින තහවුරු කර ඇති පසුබිමක ඊට අදාල ක්‍රියාමාර්ග ගන්නා මෙන් සෞඛ්‍ය ලේකම්වරයාගෙන් ඉල්ලා සිටිමට රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ විධායක සභාව තිරණය කර ඇත.

පවතින තත්ත්වයට විරෝධය පල කරමින් ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානයට අයත් රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ සාමාජික වෛද්‍යවරුන් විසින් එලඹෙන සඳුදා දින සිට අඛණ්ඩ වැඩ වර්ජන ක්‍රියාමාර්ගයක් ආරම්භ කෙරෙනු ඇත.

පියවරෙන් පියවර තිව්‍ර කිරීමට සැලසුම් කර ඇති මෙම වැඩ වර්ජන ක්‍රියාමාර්ගය පළමු පියවර ලෙස ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානය මගින් සිදු කරන බාහිර රුධිර දන්දීමේ කඳවුරු ඇණ හිටිනු ඇත. එළඹෙන සඳුදායින් පසු මිලග සති අන්තයේ සිට මෙහි ප්‍රතිඵල දැගත හැකිවනු ඇත.

මිලග පියවරයන් ලෙස අනෙකුත් රුධිර දන් දීමේ කඳවුරුත්, පෞද්ගලික අංශය වෙත රුධිරය සැපයීමේ කටයුතුත්, වකුගඩු බද්ධ කිරීමේදී ලබා දිය යුතු වාර්තා සැපයීමේ කටයුතු වලටත් බලපෑම් එල්ල වනු ඇත.

මෙම වෛද්‍ය වැඩවර්ජනය හරහා ඉතිහාසයේ කිසිදිනක නොවූ පරිදි ජාතික රුධිර පාරවිලයන සේවා කටයුතු ඇණ හිටීමේ අවදානම් මතුව ඇත.

ඒ අනුව මේ මොහොතේ හෝ සෞඛ්‍ය ලේකම්වරයා ඇතුලු බලධාරීන් වෛද්‍ය බෙල්ලනගේ දේශපාලන ගැතිකම් පිළිබඳ නොතකමින් ක්ෂණික පියවර ගත යුතුය. ඒ හරහා සමස්ථ රුධිර පාරවිලයන සේවාව තුල මතුවීමට නියමිත අර්බුදකාරි තත්ත්වය වලක්වා ගත හැකි වනු ඇත.

ස්තුතියි.

වෛද්‍ය හරිත අලුත්ගේ,
ලේකම්.

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර: | වෛද්‍ය ප්‍රසාද් කොළඹගේ | - 0716812160 |
| | වෛද්‍ය සමන්ත ආනන්ද | - 0777666301 |
| | වෛද්‍ය ධනුෂ්ක දේවප්‍රිය | - 0711891786 |
| | වෛද්‍ය ටි ගාන්දිපන් | - 0777755035 |
| | වෛද්‍ය රුවන් ජයසූරිය | - 0773000196 |
| | වෛද්‍ය නිශාන්ත සුගුණපාල | - 0773560364 |